සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අ.පො.ස. (උ.පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2026

බෞද්ධ ශිෂ්ටාචාරය I	45 S I	13 ශ්‍රේණිය	පැය දෙකයි

උපදෙස්:

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත්ම ගැළපෙන පිළිතුර තෝරාගෙන, එය උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදන්න.

1. බ්‍රාහ්මණ සමාජ ධර්ම අතර නිර්මාණවාදී ඉගැන්වීමක් ලෙස ස්වධර්ම දැක්විය හැකිය. ස්වධර්මයන් අනුව සමාජයේ උසස්ම ස්ථානය හිමිව ඇත්තේ,

   (1) ක්ෂත්‍රියන්ට ය.
   (2) වෛශ්‍යයන්ට ය.
   (3) බ්‍රාහ්මණයන්ට ය.
   (4) ශූද්‍රයන්ට ය.
   (5) පරියන්ට ය.

2. බ්‍රාහ්මණ ඉගැන්වීම අනුව අධ්‍යාපනය ලැබීමෙන් අනතුරුව තරුණ වියට පා තැබීමත් සමගම ආරම්භ වන අවධිය ලෙස දැක්වෙන්නේ,

   (1) බ්‍රහ්මචාරී අවධිය යි.
   (2) ගෘහස්ථ අවධිය යි.
   (3) වානප්‍රස්ථ අවධිය යි.
   (4) සන්‍යාසී අවධිය යි.
   (5) උපනිෂද් අවධිය යි.

3. සතුන් හා යාග ද්‍රව්‍ය රැස් කොට, සතුන් මරා, පුදා බ්‍රාහ්මණයන්ට දන් දී කරන ලද යාගය වන්නේ,

   (1) අශ්ව මේධ යාගය යි.
   (2) පුරුෂ මේධ යාගය යි.
   (3) සම්මාපාස යාගය යි.
   (4) වාජපෙය්‍ය යාගය යි.
   (5) නිරග්ගල යාගය යි.

4. ෂට් ශාස්තෘවරුන් අතුරින් "අමරාවික්ඛේපවාදය" ඉදිරිපත් කළ ශාස්තෘවරයා වූයේ,

   (1) පූරණ කස්සප ය.

Past Papers Wiki

(2) මක්ඛලී ගෝසාල ය.
(3) පකුධ කච්චායන ය.
(4) සංජය බෙල්ලට්ඨිපුත්ත ය.
(5) අජිත කේසකම්බල ය.

5. සොළොස්මහා ජනපද වලින් එකක් වන අවන්ති ජනපදයේ අගනුවර ලෙස හැඳින්වෙන්නේ,

(1) උදේනි නුවර යි.
(2) රජගහ නුවර යි.
(3) සැවැත් නුවර යි.
(4) කොසඹෑ නුවර යි.
(5) මධුරා නුවර යි.

6. බුද්ධ කාලීන භාරතයේ පැවති කර්මාන්ත අධ්‍යයනයේදී මෘදු සිනිඳු සළු, පලස්, බුමුතුරුණු, ඇතිරිලි ආදිය නිපදවන්නන් හඳුන්වන්නේ,

(1) ලෝහකරුවෝ නමිනි.
(2) කුඹල්කරුවෝ නමිනි.
(3) පේෂ කර්මාන්තකරුවෝ නමිනි.
(4) කුලාලකයෝ නමිනි.
(5) සායම් කරුවෝ නමිනි.

7. දසබල ඥාණයන්හි පෙර විසූ භවයන් විමසීමේ නුවණ හඳුන්වන්නේ,

(1) ආසවක්ඛය ඥාණය නමිනි.
(2) චුතූපපාත ඥාණය නමිනි.
(3) ඉන්ද්‍රිය පරෝපරියත්ත ඥාණය නමිනි.
(4) පුබ්බේනිවාසානුස්සති ඥාණය නමිනි.
(5) යථාභූත ඥාණය නමිනි.

8. ෂට් ශාස්තෘවරුන්ගේ ඉගැන්වීම් කිහිපයක් පහත දැක්වේ.
A - දන් දෙමින්, දන් දෙවමින්, යදිමින්, යදවමින් ගංගා නදියේ උතුරු කෙළවර දක්වා ගියේ වී නමුදු එයින් වන පිනක් නැත.
B - පුද්ගලයා විසින් කරන ලද සියලු සැප දුක් පෙර කරන ලද කර්මයට අනුව නීරණය වන බව දැක්වීම.
C - තියුණු ආයුධයකින් හිස සිඳීම මරණයක් නොවන බව දැක්වීම.
D - ආශ්වාස ප්‍රශ්වාස කිරීමේදී කුඩා සතුන් මුඛයට යන නිසා මුඛවාඩම් පැලඳීම.
E - දන් දෙනෙහි විපාක නැත. කළ මහා යාගයෙහි විපාක නැත. කුසලාකුසල කර්මයන්ගේ විපාක නැත යනුවෙන් දැක්වීම.
ඉහත ප්‍රකාශ අතරින් නිගණ්ඨනාතපුත්තගේ ඉගැන්වීම් දෙක ඇතුළත් වරණය කුමක්ද?

(1) A සහ E ය.
(2) A සහ C ය.
(3) C සහ D ය.
(4) B සහ E ය.
(5) B සහ D ය.

9. අම්බාටක නම් උයනෙහි රමණීය පන්සලක් කරවා කවුරුන්හට පූජා කළේද?

(1) චිත්ත ගහපති උපාසක තුමා ය.
(2) අනාථපිණ්ඩික උපාසකතුමා ය.

(3) පූර්වාරාම සිවුටුමා ය.
(4) මෙන්ඩක සිටුතුමා ය.
(5) මිගාර සිටුතුමා ය.

10. දස රාජ ධර්මයට ඇතුළත් නොවන කරුණක් වන්නේ,

(1) දානය යි.
(2) සීලය යි.
(3) පරිත්‍යාගය යි.
(4) භාවනාව යි.
(5) අවිහිංසාව යි.

11. කාලාම සූත්‍රයට අනුව මෙය මෙසේ යැයි ආරංචිය මාත්‍රයෙන් එකවරම යමක් නොපිළිගත යුතු බව දැක්වෙන්නේ,

(1) මා අනුස්සවේන යනුවෙනි.
(2) මා පරම්පරාය යනුවෙනි.
(3) මා පිටක සම්පදාය යනුවෙනි.
(4) මා ඉතිකිරාය යනුවෙනි.
(5) මා නය හේතු යනුවෙනි.

12. විදිය යුත්තන් තුළ පැවතිය යුතු ගුණාංග කිහිපයක් බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත. එහිදී තපෝ වෘද්ධ යනු,

(1) සීලයෙන් වැඩි යන්න යි.
(2) ගුණයෙන් වැඩි යන්න යි.
(3) තැන්පත් බවින් වැඩි යන්න යි.
(4) වයසින් වැඩි යන්න යි.
(5) නුවණින් වැඩි යන්න යි.

13. බුදුරජාණන් වහන්සේ කෘතඥතාවය කඩ ඇණයට සමාන කර ඇත්තේ,

(1) සතර සංග්‍රහ වස්තු ය.
(2) සතර අගතිය.
(3) සතර බ්‍රහ්ම විහරණය.
(4) සතර කර්මක්ලේශය.
(5) සතර සම්‍ය ප්‍රධාන වීර්යය.

14. පුද්ගලයෙකු විසින් නොකළ යුතු වෙළඳාම් 5ක් වණිජ්ජා සූත්‍රයෙහි සඳහන් වේ. එයින් "මජ්ජ වණිජ්ජා" යනු,

(1) වහලුන්, සතුන් වෙළඳාමයි.
(2) ආයුධ වෙළඳාමයි.
(3) වස විෂ වෙළඳාමයි.
(4) මස් වෙළඳාමයි.
(5) මත්පැන් හා මත් ද්‍රව්‍ය වෙළඳාමයි.

15. තමන් උපයාගත් ධනයෙන් පංච බලී ඉටු කළ යුතු බව බුදු දහම පෙන්වා දෙයි. එයින් "මළවුන් වෙනුවෙන් චාරිත්‍ර ඉටුකිරීම" දැක්වෙන්නේ,

(1) ඤාති බලි යනුවෙනි

(2) අතීථී බලි යනුවෙනි
(3) පුබ්බපේත බලි යනුවෙනි
(4) රාජ බලි යනුවෙනි
(5) දේවතා බලි යනුවෙනි

16. "තමන්ගේ ශ්‍රමයෙන් වීර්යයෙන්" දහඩිය හෙළා ඉපයූ ධාර්මික ධනයක් ඇතැයි යනුවෙන් ලැබිය හැකි සතුට,

(1) අණන සුඛය යි.
(2) භෝග සුඛය යි.
(3) අනවජ්ජ සුඛය යි.
(4) නෙක්ඛම්ම සුඛය යි.
(5) අත්ථී සුඛය යි.

17. වටිනා භාණ්ඩ ලෙස පෙන්වා රවටා මුදල් පිලිබඳ වංචා කිරීම ..... නමින් හඳුන්වයි.

(1) තුලාකූට
(2) මානකූට
(3) කංසකූට
(4) උක්කෝටන
(5) නිකති

18. දස අකුසල්වල "අභිජ්ඣා" යනුවෙන් සඳහන් වෙන්නේ,

(1) සත්වයන්ට සිදු කරන්නා වූ ජීවිත හානිය යි.
(2) අනුන් සතු යමක් සොර සිතින් ගැනීමයි.
(3) දැඩි ලෝභය යි.
(4) කෝපය යි.
(5) වරදවා වටහාගත් විශ්වාසය යි.

19. මහා මංගල සූත්‍රයේ සඳහන් මංගල කරුණු කිහිපයක් පහත දැක්වේ.
A - දන් දීම
B - ධර්මයෙහි හැසිරීම
C - සුදුසු ප්‍රදේශයක වාසය කිරීම
D - නෑදෑයින්ට සංග්‍රහ කිරීම
E - මවට හා පියාට උපස්ථාන කිරීම
මෙයින් දානංච ධම්මචරියාච..... යන ගාථාවේ ඇතුළත් මංගල කරුණු වන්නේ,

(1) A, B හා D ය.
(2) A, B හා C ය.
(3) A, C හා E ය.
(4) B, D හා E ය.
(5) C, D හා E ය.

20. ධම්ම පදයේ ගාථා ගණන, වර්ග ගණන හා නිධාන කථා ගණන පිළිවෙලට ඇති වරණය වන්නේ,

(1) 423, 25, 299
(2) 421, 26, 299
(3) 423, 26, 298
(4) 423, 26, 299

(5) 421, 26, 298

21. මහත් වූ ප්‍රඥා ඇති ශ්‍රාවකයින් අතුරින් අග්‍රස්ථානයට පත් වූයේ,

(1) මුගලන් මහරහතන් වහන්සේ ය.
(2) සැරියුත් මහරහතන් වහන්සේ ය.
(3) කාශ්‍යප මහරහතන් වහන්සේ ය.
(4) අස්සජි මහරහතන් වහන්සේ ය.
(5) අඤ්ඤාකොණ්ඩඤ්ඤ මහරහතන් වහන්සේ ය.

22. ප්‍රථම ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස සූත්‍ර පිටකය නිකාය වශයෙන් පහකට වෙන් කර භාණක පරම්පරාවට කටපාඩමින් රැගෙන යාමට පැවරිණි. මෙහිදී "ඛුද්දක නිකාය" හිමි වූයේ,

(1) ආනන්ද හිමි ඇතුළු ශිෂ්‍ය පරම්පරාවට ය.
(2) සැරියුත් හිමි ඇතුළු ශිෂ්‍ය පරම්පරාවට ය.
(3) මහා කාශ්‍යප හිමි ඇතුළු ශිෂ්‍ය පරම්පරාවට ය.
(4) පොදුවේ සියලුම භික්ෂූන්ට ය.
(5) අනුරුද්ධ හිමි ඇතුළු ශිෂ්‍ය පරම්පරාවට ය.

23. මහාදේව තෙරුන් පෙන්වා දුන් පංච වස්තුවට අයත් නොවන කරුණක් වන්නේ,

(1) රහතන් වහන්සේට නොදැනුවත්ව පව් සිදු විය හැකිය.
(2) යමෙකුට තමන් නොදැනුවත්ව ම රහත් විය හැකිය.
(3) රහත් වුවද ධර්මය පිළිබඳ සැක ඇති විය හැකිය.
(4) වචනයෙන් කියා සිහියෙන් රහත් විය හැකිය.
(5) භාවනාවේ යෙදී සිටිය දීම "දුක්ඛං" යන්න කීමෙන් රහත් විය හැකිය.

24. නෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රදේශ නවයකට ධර්මදූතයන් වහන්සේලා පිටත් කර හරින ලදි. එහිදී කාශ්මීරය ට වැඩම කළේ,

(1) මහාදේව තෙරුන් ප්‍රධාන පිරිස ය.
(2) රක්ඛිත තෙරුන් ප්‍රධාන පිරිස ය.
(3) යෝනක ධම්ම රක්ඛිත තෙරුන් ප්‍රධාන පිරිස ය.
(4) මහින්ද තෙරුන් ප්‍රධාන පිරිස ය.
(5) මජ්ඣන්තික තෙරුන් ප්‍රධාන පිරිස ය.

25. චෛත්‍යයක ගර්භයේ හැඩය අනුව ප්‍රධාන ආකෘති හයක් හඳුනා ගත හැකි වේ. මෙහි නෙල්ලිගෙඩියක හැඩය සහිත ස්තූප හඳුන්වන්නේ,

(1) බුබ්බුලාකාර ලෙස ය.
(2) පද්මාකාර ලෙස ය.
(3) ධාන්‍යාකාර ලෙස ය.
(4) ඝණ්ඨාකාර ලෙස ය.
(5) ආමලකාකාර ලෙස ය.

26. ලක්දිව පාලකයින් ඉදි කළ වෙහෙර විහාර කිහිපයක් පහත දැක්වේ.
A - ථූපාරාමය
B - ජේතවනාරාමය
C - රුවන්වැලි මහාසෑය
D - මිරිසවැටිය

PAST PAPERS WIKI

E - ලෝවාමහාප්‍රාසාදය
ඉහත දැක්වෙන වෙහෙර විහාරස්ථාන අතුරින් දුටුගැමුණු රජතුමා විසින් ඉදිකළ වෙහෙර විහාරස්ථාන ඇතුළත් වරණය වන්නේ,

(1) A, B හා C ය
(2) A, C හා D ය
(3) C, D හා E ය
(4) B, D හා C ය
(5) A, B හා E ය

27. ලංකාවේ බෞද්ධ ප්‍රතිමා ශිල්පයේදී ප්‍රධාන මුද්‍රා හයක් දැක්වේ. එයින් බෝ මැඩ මාර පරාජයේ දී බුදුරජාණන් වහන්සේ පාරමිතා පිරූ බවට මහපොළොව සාක්ෂි දැරීම සංකේතවත් වන්නේ,

(1) සමාධි මුද්‍රාව තුළිනි.
(2) භූමි ස්පර්ශ මුද්‍රාව තුළිනි.
(3) අභය මුද්‍රාව තුළිනි.
(4) වරද මුද්‍රාව තුළිනි.
(5) විතර්ක මුද්‍රාව තුළිනි.

28. ලාංකේය ස්තූප අංග අතුරින් සෙනරත් පරණවිතාන මහතාගේ අදහසට අනුව හතරැස් කොටුවෙන් පිළිඹිබු වන්නේ,

(1) සංසාරය යි.
(2) චතුරාර්ය සත්‍යය යි.
(3) නිර්වාණය යි.
(4) අෂ්ටලෝක ධර්මය යි.
(5) ආර්ය අෂ්ඨාංගික මාර්ගය යි.

29. ලංකාවේ පලමුවරට ශ්‍රී මහා බෝධිය වටා බෝධිඝරයක් තැනුවේ,

(1) දුටුගැමුණු රජු විසිනි.
(2) වළගම්බා රජු විසිනි.
(3) මිත්තසේන රජු විසිනි.
(4) දේවානම් පියතිස්ස රජු විසිනි.
(5) එළාර රජු විසිනි.

30. සිඟාලෝවාද සූත්‍රයට අනුව භෝග විනාශ මුඛ හයට ඇතුළත් කරුණක් නොවන්නේ,

(1) රහමෙර පානය යි.
(2) නොකල්හි වීදි සංචාරය යි.
(3) නෘත්‍ය දර්ශන බැලීම යි.
(4) සූදුවෙහි යෙදීම යි.
(5) බොරු කීම යි.

31. සිඟාලෝවාද සූත්‍රයෙහි දැක්වෙන යුතුකම් කිහිපයක් පහත දැක්වේ.
A - සුදුසු කාලයෙහි දායාද පැවරීම
B - ශිල්ප ශාස්ත්‍ර මනාව ඉගැන්වීම
C - ප්‍රිය වචන කථා කිරීම
D - රෝගී වූ විට උපස්ථාන කිරීම
E - යහපත් දේ කියා දෙමින් යහපතෙහි පිහිටුවීම
ඉහත කරුණු අතුරින් දෙමාපියන් විසින් දරුවන්ට කළ යුතු යුතුකම් දැක්වෙන්නේ,

(1) A සහ B තුළය.
(2) B සහ C තුළය.
(3) D සහ E තුළය.
(4) A සහ C තුළය.
(5) A සහ E තුළය.

32. ක්‍රිස්තු වර්ෂ 475 - 775 අතර කාලයේ ඉන්දියාවේ බටහිර ප්‍රාන්ත පාලනය කළ මෛත්‍රක රජවරුන් විසින් මහා විහාරයක් ඉදිකර විශ්වවිද්‍යාලයක් බවට පත් කළේ,

(1) ජගන්දලා විශ්වවිද්‍යාල යි.
(2) නාලන්දා විශ්වවිද්‍යාල යි.
(3) වික්‍රමශීලා විශ්වවිද්‍යාල යි.
(4) වලභි විශ්වවිද්‍යාල යි.
(5) ඕදන්තපුර විශ්වවිද්‍යාල යි.

33. අභිධර්ම පිටකය සඳහා අභිධර්ම විභාෂා නම් අටුවාවක් සම්පාදනය කරන ලද්දේ,

(1) ප්‍රථම ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් වශයෙනි.
(2) දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් වශයෙනි.
(3) තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් වශයෙනි.
(4) සිව්වන සර්වාස්තිවාදීන්ගේ ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් වශයෙනි.
(5) සිව්වන ථේරවාදී ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් වශයෙනි.

34. අශෝක රජු අභිෂේකයෙන් විසි වන වර්ෂයේදී ලුම්බිණිය වැඳීමට ගොස් එම ග්‍රාමය අයබදු වලින් නිදහස් කළ බව සඳහන් වන්නේ,

(1) නිගාලි සාගර් ලිපියේ ය.
(2) සාරානාත් ටැම් ලිපියේ ය.
(3) රුමින්දෙයි ටැම් ලිපියේ ය.
(4) රුප්නාත් ගිරි ලිපියේ ය.
(5) ගිරිනාර් ශිලා ලිපියේ ය.

35. බුදුරජාණන් වහන්සේගේ දින චරියාවෙහි දෙවි බඹුන් හමු වී සාකච්ඡා කිරීමට වෙන් කර නිබූ කාලය හඳුන්වන්නේ,

(1) පෙර බත් කිස නමිනි.
(2) පසු බත් කිස නමිනි.
(3) පෙරයම කිස නමිනි.
(4) මැදියම කිස නමිනි.
(5) පැසුළුයම කිස නමිනි.

36. දඹදෙණි යුගයේ රචිත පූජාවලිය රචනා කරන ලද්දේ,

(1) ධර්මසේන හිමියන් විසිනි.
(2) තොටගමුවේ රාහුල හිමියන් විසිනි.
(3) මයුරපාද පරිවෙණාධිපති බුද්ධපුත්‍ර හිමියන් විසිනි.
(4) නාගසේන හිමියන් විසිනි.
(5) විද්‍යා චක්‍රවර්තීන් විසිනි.

37. දත් කැකුළු පෑ ලා - සුරතල් සිනා සීලා..... යන පද්‍යය ඇතුළත් ග්‍රන්ථය වන්නේ,

(1) පැරකුම්බා සිරිතේ ය.
(2) ලෝවැඩ සඟරාවේ ය.
(3) බුදුගුණ අලංකාරයේ ය.
(4) සුභාෂිතයේ ය.
(5) කාව්‍යශේඛරයේ ය.

38. මහනුවර යුගයේ උඩරට සම්ප්‍රදායට අයත් චිත්‍ර දැකිය හැකි විහාරස්ථානයක් වූයේ,

(1) කැලණිය පැරණි විහාරය යි.
(2) ඇතුගම විහාරය යි.
(3) සඳගිරි විහාරය යි.
(4) මල්දෙනිය විහාරය යි.
(5) රිදී විහාරය යි.

39. සෞන්දර්ය රසාස්වාදයේ දී බෞද්ධයා විසින් අවධානයට ලක් කළ යුතු මූලික කාරණය වන්නේ,

(1) සෞන්දර්ය රසාස්වාදය ගිහි පැවිදි සෑම දෙනාටම නහනම් කර ඇති බවයි.
(2) උපාදාන අකල්පයෙන් තොරව දැහැමිව සෞන්දර්ය රසවිඳීම වරදක් නොවන බවයි.
(3) සෞන්දර්ය රසාස්වාදය වැරදි ක්‍රියාවක් බවයි.
(4) සෞන්දර්ය රසාස්වාදයෙන් ඉන්ද්‍රිය සංවරය පිරිහෙන බවයි.
(5) සෞන්දර්ය රසාස්වාදයෙන් තොර මිනිසා සමාජයෙන් ප්‍රතික්ෂේප කරන බවයි.

40. ශ්‍රී ලාංකීය බොහෝ කලා නිර්මාණ පෝෂණය කිරීමට දායක වූ මාධ්‍යයක් ලෙස ජාතක කථා සැලකේ. අතීතයේ මෙන්ම වර්තමානයේ බොහෝ නාට්‍යවේදීන් ස්වකීය නිර්මාණ සඳහා ජාතක කථා උපයෝගී කරගෙන ඇත. ඒ අතුරින් ජාතක කථා මුල් කරගෙන බිහි වූ නාට්‍යයක් වන්නේ,

(1) සකුන්තලා යි.
(2) සිරිසඟබෝ යි.
(3) සිංහබාහු යි.
(4) මනමේ යි.
(5) නල දමයන්ති යි.

41. නාරා යුගයේ දී චීනයේ ප්‍රචලිතව පැවති බෞද්ධ සම්ප්‍රදායන් හයක් ජපානය තුළ ක්‍රියාත්මක වී ඇත. එයින් විනය පදනම් කර ගත් සම්ප්‍රදාය හඳුන්වන්නේ,

(1) කුෂ නමිනි.
(2) ජෝචිත්සු නමිනි.
(3) රින්සු නමිනි.
(4) සන්රොන් නමිනි.
(5) කෙගොන් නමිනි.

42. බුදුරජාණන් වහන්සේගෙන් ධර්මය අසා සෝවාන් වූ සුමන දෙවියන් බුදුරදුන්ගෙන් කේශධාතු ඉල්ලා ගෙන ඒවා නිදන් කොට ඉදිකල ස්තූපය වූයේ,

(1) කැලණිය ස්තූපය යි.
(2) ථූපාරාමය ස්තූපය යි.
(3) මහියංගන ස්තූපය යි.
(4) ජේතවනාරාමය ස්තූපය යි.

(5) අභයගිරිය ස්තූපය යි.

43. මිහිඳුමහරහතන් වහන්සේ සහ දේවානම්පියතිස්ස රජතුමා අතර පැවති බුද්ධි ගෝචර පිළිසඳර කතා බහෙන් පසුව මිහිඳුමහරහතන් වහන්සේ දේවානම්පියතිස්ස රජු ඇතුළු පිරිසට දේශනා කළේ,

(1) දම්සක්පැවතුම් සූත්‍රය යි.
(2) කාලාම සූත්‍රය යි.
(3) වත්ථූපම සූත්‍රය යි.
(4) චූලහත්ථිපදෝපම සූත්‍රය යි.
(5) බ්‍රහ්මජාල සූත්‍රය යි.

44. ලෝකයේ පෞරාණිකම විහාරය වශයෙන් මෙන්ම ශ්‍රී ලංකා ද්වීපයේ ප්‍රථම විහාරය වශයෙන් දැක්වෙන්නේ,

(1) ජේතවන විහාරය යි.
(2) අනුරාධපුර මහා විහාරය යි.
(3) වේළුවන කලන්දක නිවාපය යි.
(4) ඝෝෂිතාරාම විහාරය යි.
(5) මින්නේරිය විහාරය යි.

45. "සබ්බ දානං ධම්ම දානං ජිනාති" යන පාලි පාඨයෙහි සිංහල අර්ථය වන්නේ,

(1) සියලු දානයන්ගෙන් උසස් දානය ධර්ම දානය බවයි.
(2) සියලු සත්වයන්ට දන්දිය යුතු බවයි.
(3) දන්දීම උතුම් මංගල කරුණක් බවයි.
(4) දන්දීම යුද්ධයකට සමාන බවයි.
(5) දානය නිවනට මග බවයි.

46. මිනිසුන්ට පමණක් නොව තිරිසන් සතුන් වෙනුවෙන්ද ගිලන් හල් ඉදිකරමින් පරමාදර්ශීව ක්‍රියා කළ රජෙකු ලෙස ..... හැඳින්විය හැකිය.

(1) දුටුගැමුණු රජු
(2) එළාර රජු
(3) බුද්ධදාස රජු
(4) දේවානම්පියතිස්ස රජු
(5) වලගම්බා රජු

47. "දොරකඩ අස්න කීම" සිදු කරනු ලබන්නේ,

(1) දානමය පිංකමකදී පුණ්‍යානුමෝදනාව අවසානයේදීය.
(2) ධර්ම දේශනාවක් පැවැත්වීමට පෙරය.
(3) මනක වස්ත්‍රය පූජා කළ පසුව ය.
(4) සති පිරිත් පිංකමක් අවසානයේ ය.
(5) මංගල චාරිත්‍රයක් වන අෂ්ටක කීමෙන් පසුව ය.

48. සිංහල පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය වශයෙන් සැලකෙන්නේ,

(1) අනුරාධපුර යුගය යි.
(2) දඹදෙණි යුගය යි.
(3) කෝට්ටේ යුගය යි.

(4) පොළොන්නරු යුගය යි.
(5) කුරුණෑගල යුගය යි.

49. සද්ධර්මාලංකාරයේ එන "ස්වර්ණ තිලකා" කථා වස්තුව ඇසුරින් නිර්මිත රමණීය දෘශ්‍ය කාව්‍යයක් වන්නේ,

(1) පෙමතෝ ජායතී සෝකෝ නාට්‍යය යි.
(2) ලෝමහංස නාට්‍යය යි.
(3) මනමේ නාට්‍යය යි.
(4) මහාසාර නාට්‍යය යි.
(5) කඳා වළලු නාට්‍යය යි.

50. "බුන්රකු" යනු දහසය වන සියවසේ අග භාගයේදී ජනප්‍රිය වූ,

(1) කලා නිකේතනයකි.
(2) රූකඩ විශේෂයකි.
(3) නාට්‍ය සම්ප්‍රදායකි.
(4) සටන් කලාවකි.
(5) සංගීත සන්දර්ශනයකි.

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අ.පො.ස. (උ.පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2026

බෞද්ධ ශිෂ්ටාචාරය II	45 S II	13 ශ්‍රේණිය	පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

උපදෙස්:

- I කොටසින් ප්‍රශ්න 02 ක් ද II කොටසින් ප්‍රශ්න 03 ක් ද තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.
- I කොටසේ එක් ප්‍රශ්නයකට අනු කොටස් 05 ක් ද II කොටසේ එක් ප්‍රශ්නයකට අනුකොටස් 02 ක් වේ.
- I කොටසේ එක් ප්‍රශ්නයකට ලකුණු I = 2, II = 3, III = 4, IV = 5, V = 6 වශයෙන් ද පිරිනැමේ. II කොටසේ එක් ප්‍රශ්නයකට ලකුණු 10 x 2 = 20 ද වශයෙන් පිරිනැමේ.

I කොටස

1. (i) ක්ෂත්‍රිය වර්ණයට අයත් ස්ව ධර්ම හතරක් නම් කරන්න. (ලකුණු 02)
   (ii) බුදුරජාණන් වහන්සේ වර්ණ ධර්ම සංකල්පය ප්‍රතික්ෂේප කළ අයුරු සාධක තුනක් මගින් ගෙන හැර දක්වන්න. (ලකුණු 03)
   (iii) බ්‍රාහ්මණ ඉගැන්වීම් තුළින් කාන්තාවගේ සාමාජික වරප්‍රසාද අහිමි වූ ආකාරය නිදසුන් හතරක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 04)
   (iv) මක්ඛලි ගෝසාලගේ ඉගැන්වීම් සැකවින් පැහැදිලි කරන්න. (ලකුණු 05)
   (v) බුද්ධ කාලීන භාරතයේ පැවති වෙළඳ ආර්ථිකය පිළිබඳ විවරණයක් සපයන්න. (ලකුණු 06)

2. (i) බුදුරජාණන් වහන්සේ "සුගත" නාමයෙන් හැඳින් වීමට හේතු වූ සාධක දෙකක් නම් කරන්න. (ලකුණු 02)
   (ii) බුදුරජාණන් වහන්සේ මහා කරුණා ගුණය ප්‍රකට වන අවස්ථා තුනක් කෙටියෙන් ගෙන හැර දක්වන්න. (ලකුණු 03)
   (iii) විශාඛා මහෝපාසිකාව තුළ පැවති චරිත ලක්ෂණ තුළින් ලැබිය හැකි ආදර්ශ හතරක් පැහැදිලි කරන්න. (ලකුණු 04)
   (iv) බුද්ධ කාලයේ පැවති රාජාණ්ඩු රාජ්‍ය හතර නම් කර රාජාණ්ඩු ක්‍රමය තුළ දැකිය හැකි ලක්ෂණ හතරක් පැහැදිලි කරන්න. (ලකුණු 05)
   (v) සියලු සත්වයන්ගේ අයිතිවාසිකම හා හිමිකම් තහවුරු කිරීමෙහිලා බුදු දහමේ එන පංච ශීල ප්‍රතිපත්තිය ඉවහල් වන අයුරු පෙන්වා දෙන්න. (ලකුණු 06)

3. (i) "උට්ඨානවකෝ සතිමකෝ" යන ධම්ම පද ගාථාව නිවැරදිව සම්පූර්ණ කරන්න. (ලකුණු 02)

(ii) ඉහත 3(i) හි සඳහන් ගාථාවේ අර්ථය ලියා දක්වන්න. (ලකුණු 03)

(iii) ගුරු - සිසු යුතුකම් හා වගකීම් දහය සිඟාලෝවාද සූත්‍රයට අනුව නම් කරන්න. (ලකුණු 04)

(iv) පරාභව සූත්‍රයේ සඳහන් පුද්ගලයාගේ පරිහානියට හේතුවන කරුණු පහක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(v) මංගල සූත්‍රයෙහි සඳහන් පුද්ගලයාගේ මෙලොව දියුණුවට හේතු වන මංගල කරුණු හයක් පිළිබඳ කෙටි විවරණයක් සපයන්න. (ලකුණු 06)

II කොටස

4. (i) දැහැමි රාජ්‍ය පාලනයක් උදෙසා දසරාජ ධර්මවල අදාළත්වය සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(ii) සෞන්දර්යය රසාස්වාදය බුදු දහමින් බාධාවක් නොවන බව සනිදර්ශනව පෙන්වා දෙන්න. (ලකුණු 10)

5. (i) දෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට බල පෑ හේතු දක්වා එම සංගායනාවේ ප්‍රතිඵල බුදු සසුනේ චිරස්ථිතිය උදෙසා බල පෑ අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) බුදු දහමේ උන්නතියට කණිෂ්ක රජුගෙන් සිදු වූ සේවාව ඓතිහාසික සාධක ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

6. (i) මහින්දාගමනයේ ප්‍රතිඵලයක් ලෙස මහා විහාරය කේන්ද්‍ර කොට ගෙන මෙරට ඇති වූ අධ්‍යාපනික, ආගමික සහ සංස්කෘතික දියුණුව පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 10)

(ii) චීන සංස්කෘතියේ පෝෂණයට බුදු සමයෙන් ලද ආභාෂය නිදසුන් සහිතව ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

7. (i) දඹදෙණි යුගයේ සිංහල ගද්‍ය සහ පද්‍ය සාහිත්‍යය බුදු සමයෙන් පෝෂණය වූ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) ධර්මාශෝක රජතුමාගෙන් සිදු වූ ශාසනික මෙහෙවර ප්‍රමාණවත් සාධක මගින් ඇගයීමට ලක් කරන්න. (ලකුණු 10)

8. (i) බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය හා විකාශය පිළිබඳ විවරණයක් සපයන්න. (ලකුණු 10)

(ii) පහත සඳහන් මාතෘකා අතුරින් දෙකකට ප්‍රමාණවත් විස්තර සපයන්න. (ලකුණු 5 x 2 = 10)

1. කොරවක්ගල
2. බුදුගුණ අලංකාරය
3. මහනුවර යුගයේ බිතුසිතුවම්
4. සීවලී රහතන් වහන්සේ

බෞද්ධ ශිෂ්ටාචාරය.

13 ශ්‍රේණිය. 2026

වර්ෂ අවසාන පිළිතුරු පත්‍රය

1 කොටස

1 - 3	11 - 4	21 - 2	31 - 5	41 - 3
2 - 2	12 - 3	22 - 4	32 - 4	42 - 3
3 - 5	13 - 1	23 - 4	33 - 4	43 - 4
4 - 4	14 - 5	24 – 5	34 - 3	44 - 2
5 - 1	15 - 3	25 - 5	35 - 4	45 - 1
6 - 3	16 - 5	26 - 3	36 - 3	46 - 3
7 - 4	17 - 3	27 - 2	37 - 5	47 - 4
8 - 5	18 - 3	28 - 2	38 - 5	48 - 3
9 - 1	19 - 1	29 - 4	39 - 2	49 - 1
10 -4	20 - 4	30 - 5	40 - 4	50 - 2

(1) i. ප්‍රජා රක්ෂණය, දන් දීම, පුද පූජා කිරීම ඉගෙනීම, කාමයෙහි නොඇලී ක්‍රියා කිරීම.

ii. බුදුරජාණන් වහන්සේ වර්ණ ධර්ම සංකල්පය ප්‍රතික්ෂේප කර ඇත.

* ජීව විද්‍යාත්මක සාධක :-

ගහකොළ, සතා සිවුපාවා සාධක ලෙස ගෙන වර්ණ ධර්ම ප්‍රතික්ෂේප කිරීමයි. මහා තණ්හා සංඛ්‍යා සූත්‍රය තුළින් බ්‍රාහ්මණ හා ශුද්‍ර යන දෙදෙනාම බිහි වීම කෙරෙහි එකම සාධකය බලපාන බව දක්වා ඇත.

*මව සෘතු වීම, මව පියා එක්වීම, ගන්ධබ්බයෙකු පැමිණීම,

* ඓතිහාසික සාධක :-

ඉතිහාසයට අයත් තොරතුරු සාධක ලෙස ගෙන වර්ණ ධර්ම ප්‍රතික්ෂේප කරයි. අග්ගඤ්ඤ සූත්‍රය තුළින් පහත කරුණු සඳහන් කර ඇත. *පෘථිවියේ ගිනි ගැනීම, ආභස්සර බඹලොවින් පැමිණ පදිංචි වීම, සිරුරෙන් ආලෝකය පිට කිරීම ඇල් වී ආහාරයට ගැනීම වැනි දේ .

*සමාජ විද්‍යාත්මක සාධක :-යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳ දැනුම සාධක ලෙස ගෙන වර්ණ ධර්ම ප්‍රතික්ෂේප කිරීම. අග්ගඤ්ඤ සූත්‍රය:- ක්ෂත්‍රිය කුලය -නීතිය ක්‍රියාත්මක කිරීම' දඩුවම් දීම. වෛශ්‍ය කුලය:- කර්මාන්ත කරමින් ධනය ඉපයීම. ශුද්‍ර කුලය:- වැරදි වැරදි වැඩ කරමින්යුතුකම් ඉටු නොකළ නිසා පහත් විය.

බ්‍රාහ්මණ කුලය:- ආගමික කාර්යයන්හි නියැලීම.

iii. බ්‍රාහ්මණ ඉගැන්වීම් තුළින් කාන්තාවගේ සාමාජික වරප්‍රසාද අහිමි වී තිබුණි.

*උපතේ සිට මරණය දක්වාම නිදහස නො පැවතුණි.

*දියණියක් ලෙස :-

. පියා යටතේ වාසය කළ යුතුයි, පිතෘ මූලික විවාහයක් පැවතුණි., සමාජ ඇසුර තහනම් වීම,

*බිරිඳක් ලෙස :-

සති පූජාව සිදු කිරීම, පර්දා ක්‍රමය, මවක් ලෙස :වැඩිමහල් පුතුන් ළඟ සිටිය යුතු ය, අධ්‍යාපනය ලැබීමට අවස්ථාව නොලැබුණි. ආගමික නිදහස නොලැබුණි.

iv මක්කලි ගෝසාලගේ ප්‍රධාන ඉගැන්වීම් ලෙස නියතිවාදය, අධිච්ච සමුප්පන්න වාදය, අහේතු අප්පච්චයතා වාදය, අහේතු වාදය, පරිණාම වාදය ආදිය හඳුනාගත හැකිය.මේ සියලු නම් වලින් අදහස් වන්නේ ලොව පවත්නා සියල්ල හේතු ප්‍රත්‍යය රහිතව ඉබේම සිදුවන බවත්ය. මක්ඛලිගේ ඉගැන්වීම නත්තිකම්ම නත්තිකිරිය "නත්ථි කම්ම,නත්ථි කිරිය, නත්ථි විරිය" යන පදවලින් හැඳින්වේ. තමා විසින් කළ යුතු කර්මයක් නැත. සැප ලැබුමට ඉවහල් වන බලය කියා එකක් නැති බව දක්වයි. මෙම ඉගැන්වීම මගින් කර්ම විපාක බැහැර කරන නිසා නිසා මක්ඛලිගෝසාල අකිරිය වාදියෙකු ලෙස ද හැඳින්විය හැකිය. මොහුගේ ඊළඟ ඉගැන්වීම වනුයේ නියතිවාදියයි .එනම් සිදුවීමට ඇති දෙයක් පිළිබඳව පූර්ව විනිශ්චයක් සිදු කිරීමයි.

v. බුද්ධකාලීන භාරතයේ පැවති වෙළඳ ආර්ථිකය පිළිබඳ විමසීමේදී ක්‍රිස්තු පූර්ව 6 වන සියවස දක්වා ඇතට දිව යයි.උපන්නක ජාතකය තුළින් ගැල් පන්දාහක් බැගින් භාවිතා කරමින් වෙළෙඳ කටයුතුවල නිරත වූ බව බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ.තවද ගොඩ කළ මාවත් අඩි පාර ගුරුපාර ගල් ඇතිරූ මාවත් පිළිබඳව උම්මග්ග ජාතකයෙන් පැහැදිලි වේ.

* සැවැත් නුවර සිට සාකේත කොසඹෑ, විදිසා, උදේනි හරහා වෙළඳ මාවතක්ද, සැවැත් නුවර සිට රජගහනුවර තෙක් කැපිලවස්තුව, කුසිනාරාව, පැළලුප් නුවර හරහා වෙළඳ මාවතක්, බරණැස සිට චේරංජාවතෙක් වෙළඳ මාවතක්ද තිබූ බව දැක්වේ.

* වෙළඳ ආර්ථිකයක් සමඟ කාසි භාවිතය ද සිදුවුනි. මුදල් භාවිතයට හුරුවීම මගින් මස්ස, අඩමස්ස, කහවණු වැනි ලෝහ කාසි භාවිතා කිරීම සේරිවාණිජ ජාතකයෙන් පැහැදිලි වේ.

(2) i බුදුරජාණන් වහන්සේ සියලු කෙලෙස් බිඳ දමා නිවනට ගමන් කළ හෙයින්,යහපත් ගමන් ඇති හෙයින්,සුන්දර වූ වචන ප්‍රකාශ කරන හෙයින්,සුගත නම් වන සේක.

ii. අනුන්ගේ දුකේදී යහපතුන්ට යහපත් සිහියෙන් යුතුව ඇතිවන කම්පනය කරුණාවයි. එය "පරදුක්ඛේ සති සාධුනං හදේ කම්පනං කරෝතීති කරුණා" යනුවෙන් දක්වයි.

*උදා:- පටාචාරා, රජ්ජුමාලා, කිසාගෝතමී, මට්ටකුණ්ඩලී, සෝපාක, සුනීත වැනි අයට මෙන්ම තිරිසන්ගත සත්වයන්ටද මහා කරුණාව දැක්වූහ. උදාහරණයක් ලෙස නාලාගිරි ඇතා, භද්‍රවතිකා ඇතින්න.

iii *බිරිඳක ලේලියක මවක ලෙස සිය යුතුකම් හා වගකීම් නිසි පරිදි ඉටු කිරීම.

*ධන බලයෙන් හා රූමත් කමින් උඩඟු නොවීම , අලස නොවී කඩිසරව ක්‍රියා කිරීම.

*ආගමට දහමට ලැදිව කටයුතු කිරීම, බුද්ධිමත්ව තීරණ ගෙන ක්‍රියා කිරීම, විවාහය නිසා තම ආගම වෙනස් නො කිරීම.

iv මගධ, කෝසල, වත්ස, අවන්ති,

* රාජානු ක්‍රමය තුළ දැකිය හැකි ලක්ෂණ:-
* ප්‍රබල රජෙකු වීම, පිය පුතු පරපුරෙන් රාජ්‍යත්වය උරුම වීම, ව්‍යවස්ථාදායක විධායක හා අධිකරණ බලතල රජුට හිමිවීම, යුවරජ පුරෝහිත අධිකරණ නායක සේනාධිපති මගින් බලය ක්‍රියාත්මක වීම, රජුගේ වාසස්ථානය අගනුවර පිහිටා තිබීම,මත්ස්‍ය න්‍යාය අනුගමනය කිරීම වැනි ලක්ෂණ දැකිය හැක.

v. සියලු සත්ත්වයන්ගේ යහපත අර්ථ සිද්ධිය හා ආරක්ෂණය උදෙසා ආගමික හා දාර්ශනික මගපෙන්වීමක් ලබා දෙන බුදු දහම මානව අයිතිවාසිකම් හිමිකම් හා ආරක්ෂණය පිළිබඳව ද අවධානය යොමු කරයි.

* පළමු ශික්ෂා පදය ප්‍රාණඝාත පටිවිරතියයි.ප්‍රාණඝාතය අත හැර අතහැර පාලකයා මෙම සිඛ පදය ආරක්ෂා කිරීම මගින් රටේ ජනතාවගේ පමණක් නොව මෘග පක්ෂීන්ගේ පවා ජීවිත ආරක්ෂාව සිදුවේ.තවද සොරකමින් තොර වීම, කාමය වරදවා හැසිරීමෙන් වැළකීම, බොරු කීමෙන් වැළකීම, මදයට හා ප්‍රමාදයට හේතුවන රහමෙර පානයෙන් වැළකීම යන ශික්ෂා පද ආරක්ෂා කිරීම තුළින් යහපත් සමාජයක් නිර්මාණය කගත හැකිය.එනිසා පංච සීල ප්‍රතිපදාව රටක ප්‍රසන්න බව සමෘද්ධිය හා අන්‍යෝන්‍ය සබඳතා ඇති කිරීමට උපස්ථම්භක වන බව ඉතා පැහැදිලිය.

(3) I. උට්ඨානවතෝ සතිමතෝ - සුචිකම්මස්ස නිසම්ම කාරිනෝ

සඤ්ඤතස්සච ධම්ම ජීවිනෝ - අප්පමත්තස්ස යසෝභි වඩ්ඩති

ii. නැඟී සිටී වීර්යය ඇති, මනා සිහිය ඇති, නිදොස් දේ කරන, විමසා බලා කටයුතු කරන, තැන්පත් දැහැමි දිවි පැවතුම් ඇති, නොපමා පුද්ගලයාගේ කීර්ති මනාව වැඩේ.

Iii.සිසුවාගෙන් ගුරුවරයාට ඉටුවිය යුතු යුතුකම් :-

ගුරුවරයා දුටු විට හුනස්නෙන් නැඟී සිටිය යුතුය, ගුරුවරයාට අවශ්‍ය උපස්ථාන කළ යුතු ය.

ගුරු බසට ඇහුම් කන් දිය යුතුය, ගුරුවරයාට අවශ්‍ය කටයුතු ඉටු කර දිය යුතුය.

මැනවින් ඉගෙන ගත යුතුය.

*ගුරුවරයාගෙන් සිසුවාට ඉටු විය යුතු යුතුකම්:-

ශිෂ්‍යයන් මනාව හික්මවාලිය යුතුය, ශිෂ්‍යයාට මැනවින් ඉගැන්විය යුතුය.

ගුරුවරයා දන්න සියලු ශිල්ප ශාස්ත්‍ර ශිෂ්‍යයාට කියා දිය යුතුය, තම මිත්‍රයන්ට ශිෂ්‍යයාව හඳුන්වාදිය යුතුය, ශිෂ්‍යයා උවදුරු වලින් වළක්වා ගත යුතුය.

iv *ධර්මයට ද්වේශ කරන්නා පිරිහෙයි , අසත් පුරුෂයන්ට ප්‍රිය වන්නා පිරිහෙයි, සත්පුරුෂයන්ට ප්‍රිය නොවන්නා පිරිහෙයි, අසත්පුරුෂ ධර්මයට ප්‍රිය වන්නා පිරිහෙයි, නිතර නිදන සුළු තැනැත්තා පිරිහෙයි, දොඩමළුව පිරිස සමග කාලය ගත කරන්නා පිරිහෙයි, උට්ඨාන වීර්යයෙන් තොරව කටයුතු කරන්නා පිරිහෙයි .....

v. මෙලොව දියුණුවට හේතු වන මංගල කරුණු :-

*බාලයන් ඇසුරු නොකිරීම, පණ්ඩිතයන් ඇසුරු කිරීම, පිදිය යුත්තන් පිදීම, සුදුසු ප්‍රදේශයක වාසය කිරීම, පෙර කළ පින් ඇති බව, සිත මනාසේ පිහිටුවා ගැනීම, බොහෝ ඇසූ පිරූ තැන් ඇති බව, ශිල්පයෙහි දක්ෂ බව ....

(4) i දැහැමි රාජ්‍ය පාලනයක් උදෙසා දස රාජ ධර්ම බෙහෙවින් උපකාරී වේ. එනම් දානය, සීලය ,පරිත්‍යාගය, සෘජු බව, මෘදු බව, තපස, අක්‍රෝධය, අවිහිංසාව, අවිරෝධතාව යන කරුණු පාලකයා තුළ තිබිය යුතුය. මෙහිදී දානය යනුවෙන් දක්වන්නේ පූජාවක් වශයෙන් හෝ අනුග්‍රහයක් වශයෙන් හෝ තමා සන්තකව පවත්නා උපභෝග පරිභෝග වස්තූන් අදාළ පුද්ගලයන්ට හෝ කණ්ඩායම්වලට ලබා දීමයි. රටේ පාලකයා රට වැසියා වෙනුවෙන් දෙනු ලබන සියලු දේ මෙයට අදාළ වේ. ගොවීන් සඳහා ධාන්‍ය බීජ පොහොර ආදිය ලබා දීමද මෙයට අදාළ වේ.තවද රටේ පාලකයා සිල්වත් විය යුතුයි එවිට ජනතාවද ශීෂ්ය සම්පන්න වෙයි.තවද පාලකයා පරිත්‍යාගෙන් යුක්තව කටයුතු කළ යුතුය එසේම සෘජු තීරණ ගත යුතුයි මෘදු විය යුතුයි ඉවසීමෙන් ක්‍රෝධයෙන් තොරව කටයුතු කරන කෙනෙක් විය යුතුයි. එවිට දැහැමි සමාජයක් ගොඩනඟා ගත හැකිය.

ii සෞන්දර්ය රසාස්වාදය බුදු දහම අගය කොට ඇත සෞන්දර්ය යනු ඉන්ද්‍රියයන් හා මනස ප්‍රසන්න බවට පත් කරන සුන්දර දෙයට අයත් නැතහොත් සුන්දරත්වය දරා සිටින ස්වභාවයයි. බුදු දහමේ දැක්වෙන පරිදි සෞන්දර්ය රසාස්වාදය කොටස් දෙකකට බෙදේ.

1. ස්වභාවික සෞන්දර්ය රසාස්වාදය

2. නිර්මාණාත්මක සෞන්දර්ය රසාස්වාදය යනුවෙනි.

ගසක් යට ඉපිද, ගසක් යට බුදු වී, ගසක් යට ප්‍රථම ධර්ම දේශනය කරමින් ගසක් යට පිරිනිවන් පෑ බුදුරජාණන් වහන්සේ අසීමිත ලෙස ස්වභාව සෞන්දර්ය ප්‍රිය කළ බව බෞද්ධ සාහිත්‍යයේ දැක්වේ. තවද උන්වහන්සේ භාවනා කිරීමට තෝරා ගත්තේ සුන්දර පරිසරයයකි.සුදු වෙලි තලාවලින් ගහන ගලා යන නේරංජනා නදිය අසල රමණීය භූමියක් තෝරා ගෙන බුද්ධත්වය සඳහා උන්වහන්සේ පදන් වීර්යය වැඩූ බව අරිය පරියේෂණ සූත්‍රයේ දැක්වේ. "රමණීයං භූමි භාගං පාසාදිකඤ්ච වන සන්දඤ නදිංච සේතකං සුපතිත්ථං රමණීයං..."

(5) i දෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට මූලිකම හේතුව වූයේ වජ්ජී පුත්තක භික්ෂූන් අනුගමනය කළ දස අකැප වස්තුවයි.එසේම වසු මිත්‍ර තෙරුන් පෙන්වා දෙන්නේ මහා දේව තෙරුන්ගේ පංච වස්තුව හේතු වී ඇති බවයි.

*දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ලෙස :-

*වජ්ජපුත්තක භික්ෂූන් අනුගමනය කළ දස අකම වස්තු ප්‍රතික්ෂේප කිරීම .

*නිකාය භේදය ඇතිවීම මහා සාංඝික නමින් නව නිකායක් පිහිටුවා ගැනීම.

*මහා සාංඝිකයන් නිකා 6 කටද, ථේරවාදීන් නිකාය 12කටද ආදී වශයෙන් නිකාය 18 ක් ලෙස බෙදී යෑම.

*මහායාන බුදු දහම ඇතිවීම.

*තවද බුදු සමයේ මුල් ස්වරූපය ඉක්මවා ගොස් පශ්චාත් බෞද්ධ දර්ශනය බිහි විය.එකී මහායාන අදහස් භාරතයේ උතුරු ප්‍රදේශවලද පසුව විවිධ රටවල ද පැතිර ගිය බව පෙනේ.

ii .* කුෂාණ වංශ පරම්පරාවෙන් පැවත එන කණිෂ්ක රජු "ද්විතීය ධර්මාශෝක" යන නමින් හැඳින්වේ. කණිෂ්ක රජු අධිරාජයා බවට පත්වීමෙන් පසු කාශ්මීර, යාර්කාන්ඩ්, බෝධාන්, චීන තුර්කිස්ථාන් යන භාරතයෙන් පිට ප්‍රදේශද ආක්‍රමණය කර පාලනය කළේය.

* දෙසාලිස් වසක්(42) රාජ්‍ය විචාළහ.චීන දේශාටක පාහියන් හා හියුංසියාං යන තෙරවරුන් දෙපළම කනිෂ්ක රජු ගැන වාර්තාකරර ඇත.උපතින් හින්දු භක්තිකයෙකු වූ කනිෂ්ක රජු බුදුසමය වැළඳ ගත් පුවත හියුං සියැං සිය වාර්තාවේ මෙසේ සඳහන්වේ "ධර්මා ධර්ම විවේචනයක් නොකළ මේ රජ පළමුවෙන් බුදු දහම පහත් කොට සැලකීය. දිනක් පඳුරු සහිත වගුරු බිමක ඇවිදින රජු සුදු හාවකු දැක ඌ අනුව යන්නේ අඩි තුනක් පමණ උසැති කුඩා සෑයක් ගොඩනහන ගොපළු දරුවෙකු දුටුවේය. තෝ කුමක් කෙරෙහි දැයි ඇසූ විට මෙවර රාජ්‍යයට පත් වන රජෙක් මගේ ශරීර

* ධාතුවලින් විශාල කොටසක්පිහිටුවා මේ තැන ස්ථූපයක් ගොඩනංවන්නේ යැයි ශාක්‍ය මුනීන්ද්‍රයන් වහන්සේ විසින් ප්‍රකාශ කරනා ලදි.

* කනිෂ්ක අධිරාජයෝ පුරාකෘත පුණ්‍ය ඇත්තෝය ඒ උත්තම ශාස්තෘවරයාගේ අනාවැකිය සිද්ධ කිරීමට මෙය යෝග්‍ය කාලය වන බව සිහිපත් කරමි උත්තර දී ගොපළු දරුවා නොපෙනී ගියේය මේ කීම ඇසූ රජ මහත් ප්‍රීතියට පත්ව බෞද්ධාගමට ගෞරව කරමින් බුද්ධාගම වැළඳ ගත්තේය.

(6) i. දේවානම්පියතිස්සේ රාජ්‍ය සමයේ මිහිඳු මහරහතන් වහන්සේ විසින් ලක්දිව බුදු දහම ස්ථාපනය කිරීමේ දී පිහිටුවන ලද.මහා විහාරය කේන්ද්‍ර කොට ගෙන මෙරට ඇතිවූ අධ්‍යාපනික මධ්‍යස්ථාන මගින් සුවිශාල සේවයක් සිදුවිය ගමයි පන්සලයි අතර පැවති සබඳතාව වඩා ශක්තිමත්ව සමාජගත වීමට භික්ෂූන් වහන්සේලාගේ මූලිකත්වයෙන් ආරම්භ වුණු ශාස්ත්‍රීය සේවාව හේතු සාධක විය.මෙකල සුවිශේෂී අධ්‍යාපන මධ්‍යස්ථාන රැසක් බිහි වුණි.

* සුනහාත පිරිවෙන * දික්සඳ සෙනෙවියා පිරිවෙන * දීඝ වංකමණ පිරිවෙන

* මරුගණ පිරිවෙන * ථේරාපස්සය පිරිවෙන * ඵලග්ග පිරිවෙන

ඒ අතර ප්‍රධාන වේ මහා විහාරයෙහි භික්ෂූන් වහන්සේලා රටවැසියන්ගේ සාක්ෂරතාව හා බෞද්ධ සංස්කෘතිය ගොඩනැංවීම විෂයෙහි නොමඳව වෙහෙසුණහ.

මහා විහාරය කේන්ද්‍ර කොට ගෙන මෙරට ඇතිවූ ආගමික හා සංස්කෘතික දියුණුව අපිරිමිතිය මහා විහාරික භික්ෂූන් සෑම විටම මහජනයාට ලෞකික හා ලෝකෝත්තර ජීවිතය මැනවින් සකස් කර ගැනීම විෂයෙහි නිරන්තරයෙන් ධර්මයෙන් අනුශාසනා කළහ.උන්වහන්සේලා නිරන්තරයෙන් වෙහෙස වූයේ අධ්‍යාපනය ලබාදීම හා මහජනතාවගේ ආර්ථික කටයුතු ධාර්මිකව සිදු කර ගත යුතු ආකාරය දේශනා කිරීම සඳහා ය.

මහා විහාරය මූලික කොටගෙන හෙළ කලාවේ ආරම්භයද සිදුවිය සංඝමිත්තා තෙරණිය මෙරට කැඳවාගෙන ආ දඟඅට කුලයක පිරිසකගෙන් විවිධ කර්මාන්ත ලාංකීය සංස්කෘතියට එකතු විය.ඒ අතර ගෘහ නිර්මාණ ශිල්පය සුවිශේෂ වේ. මහා විහාරය මූලික කොට ගෙන මෙම ගෘහ නිර්මාණ ශිල්පිය ඇතුළු සියලු කලාවන් වර්ධනය විය.

ii. චීන ජනතාවට බුදු දහමේ ආභාෂය ලැබුනේ මින් නීරාජ්‍ය කාලයේ සිටය එතැන් සිට පැරණි ආගමික විශ්වාස බෞද්ධ අදහස් සමග සංකලනය වී නව ජන ජීවිතයක් හා ආචාර ධර්ම පද්ධතියක් සකස් විය.ඔවුන්ගේ

පැරණිම ලේඛන වෙන්කර ඇත්තේ දෙවියන්ගේ හා යකුන්ගේ තත්ත්වය ආරෝපණය කරනු ලැබූ මිය ගිය මුතුන් මිත්තන් පිදීමේ සිරිත් ලියා තැබීමටය .දෙවන අවධියේදී විවිධ මිථ්‍යා කතා ලියා තැබීමට උණ පොත් භාවිතා කළහ. තෙවන අවධිය තාඕ වාදී කොන්ෆියුසියස් වාදී හා මෝ-වාදී යන ගුරු කුල තුනෙහි ආභාසය ලබා සංවර්ධනය විය.බුදු දහම ලැබීමෙන් අනතුරුව එහි ආභාෂයෙන් චීන සාහිත්‍ය පෝෂණය විය අටුවා කතා ජන කවි උතුරු හා දකුණු නාට්‍ය ශූ-කුන්-ත්‍යාම් ආදී කාව්‍ය බිහිවීම ඒ අනුව සිදුවිය.

චීනය තුළ බුදු දහම ව්‍යාප්ත කිරීමේදී මහායාන බුදුදහමට අදාළ සංස්කෘත ග්‍රන්ථ රාශියක් චීන භාෂාවට පරිවර්තනය කරන ලදී.සද්ධර්ම පුණ්ඩරික සූත්‍රය, සුරංගම සූත්‍රය, විමලකීර්ති නිර්දේශය ඒ අතර කිහිපයකි.එම ග්‍රන්ථ එකතු වීමෙන් නව සාහිත්‍යයක් බිහි විය.

(7) I දඹදෙණි යුගයේ රචිත බොහෝ සාහිත්‍යය නිර්මාණ සඳහා බෞද්ධ ආභාසය ලැබී ඇති අයුරු එම නිර්මාණ අවසානයේදී පැහැදිලි වේ.ජාතක කතා, බුද්ධ චරිතය, ලාංකේය ශාසන ඉතිහාසය, ත්‍රිවිධ චෛත්‍යය හා බැඳුණු පූජනීය වස්තූන් මුල්කරගෙන මෙම සාහිත්‍ය නිර්මාණය වූ බව දඹදෙණි සාහිත්‍ය යුගයේදී රචිත ගද්‍ය සාහිත්‍ය කෘති අතර සද්ධර්මරත්නාවලිය, පූජාවලිය ,දහම් සරණ, සහසරණ, ථූපවංශයත් පද්‍ය සාහිත්‍ය කෘති අතර හෙළයේ මහා කාව්‍ය ලෙස සැලකෙන කව්සිළුමිණ මින සාහිත්‍යය කෘතියත් වැදගත් වේ. බුත්සරණ නම් වූ ගද්‍ය නිර්මාණය ද මෙම යුගයේම රචනා වූ වායැයි ඇතැම් විද්වතුන්ගේ අදහසයි.

ii. මෞර්ය වංශයේ තුන්වන පාලකයා වූ අශෝක රජතුමා බෞද්ධ සාහිත්‍යයේ ධර්මාශෝක නමින්ද හින්දූ සාමයක ග්‍රන්ථවල අශෝක වර්ධන නමින්ද හැඳින්වේ.

*අශෝක රජු තම සෙල්ලිපිවල නම සඳහන් කර ඇත්තේ දේවානම් පිය දසි යනුවෙන්ය.මස්කි ලිපියේ පමණක් අශෝක යන නම දක්නට ලැබේ.පිය දසි ලාජා, දේවානම්පිය දසි, පියදාස, චණ්ඩාශෝක, ධර්මාශෝක යන නම් වලින් ද අශෝක රජු හැඳින්වේ.

*අශෝක රජුගේ පියා බිංදුසාර වන අතර මව ධර්මානම් බිසවක බව මහාවංශය හා සද්ධර්ම රත්නාකරය කියයි.

දඹදිව මධ්‍ය දේශය මූලික කොට ගෙන බුදු දහම ව්‍යාප්ත කිරීමේ මෙහෙවරක නිරත වූ අශෝක රජතුමා බුදු දහමට ප්‍රමුඛස්ථානයක් පිරිනිවූ අතර තමාද බෞද්ධයකු ලෙස කටයුතු කළේය.

*සාංචි සාරානාත් යන ස්ථානයන්හි පිහිටුවා ඇති සෙල්ලිපිවල සඳහන් වන අන්දමට භේද බින්න වී සිටි භික්ෂූන් සමගි කළ ශාසන සංශෝධනයක අවශ්‍යතාව පෙන්වා දී එය ක්‍රියාවට නැන්වූයේය.බුදු සසුනේ විරස්ථිතිය පැතූ ධර්මාශෝක රජු බෞද්ධ වෙහෙර විහාර අසූහාරදාහක් කරවූ බව සාංචි ස්ථූපය එතුමා විසින් ගොඩනංවන ලද ස්ථූපතුරෙන් ප්‍රධාන විය.සෙල්ලිපි, පුවරු ලිපි, ටැන් ලිපි, ස්තම්භ ලිපි, ආදිය මගින් මෙන්ම ධර්ම මහා මාත්‍රවරුන් මගින්ද බුදු දහමේ එන ඉගැන්වීම් ප්‍රචාරණය කළේය.

*සංගීතය අවසානයේ මොග්ගලිපුත්ත තිස්ස මහා තෙරණුවන්ගේ උපදෙස් ඇති ප්‍රධාන වශයෙන් රටවල් නවයකට ධර්මදූතයන් පිටත් කර යැවීය.සිය දරු දෙදෙනා සසුන්ගත කිරීමට අශෝක රජු කටයුතු කළේය.ලක්දිවට උතුම් බුදු දහම හඳුන්වා දුන් මිහිඳු මහරහතන් වහන්සේ සහ ශ්‍රී මහා බෝධිය වැඩම කළ සංඝමිත්තා මහ රහත් තෙරණියද අශෝක රජුගේ දරුවන් දෙදෙනා විසින් ය.

(8) i ප්‍රථම වරට බුද්ධ ප්‍රතිමාව නිර්මාණය කළේ කවර කලෙක කවරෙකු විසින්ද යන්න පිළිබඳව විවිධ මත පවතී. ප්‍රවාද කථා සාහිත්‍ය මූලාශ්‍රය හා පුරා විද්‍යාත්මක සාධක පදනම් කරගෙන එම මත ඉදිරිපත් වී ඇත.ජනප්‍රවාදයට අනුව බුද්ධ ප්‍රතිමාව නිර්මාණය කර තිබෙන්නේ බුද්ධ කාලයේදීමය දහ අටවන සියවසේ ලංකාවේදී ලියන ලදැයි සැලකෙන කෝසලබිම්බ වර්ණනාවට අනුව බුදුරජාණන් වහන්සේ ජීවමාන කාලයේම කොසොල් රජු විසින් ඔහුගේ රාජධානිය වූ ජේතවනාරාමයේ සඳුන් ලියෙන් බුදු පිළිමයක් කරවන ලදී.

*අනේපිඬු සිටුතුමා - බුද්ධ ප්‍රතිමාවක් නෙළීමට බුදුන්ගෙන් අවසර ගැනීම(කාලිංග බෝධි ජාතකය)

*අශෝක රාජ සමය- මහාකාල නාග රජු මැවූ බුද්ධ ප්‍රතිමාවකට සත් දිනක් වැඳුම් පිදුම් කිරීම.

(Ii) i කොරවක්ගල යනු:-

ගොඩනැගිල්ලක පිවිසීමට ඇති පියගැට පෙළට දෙපසින් මුරගලට පිටුපසින් පිහිටුවා ඇති අලංකාර ගල් පුවරුව,මුරගලේ සංවර්ධනීය අවස්ථා,ආනතතලය සහිත ගල් පුවරුව,කැටයම් සහිත ගල්පුවරුව,ශීර්ෂ මකර මුඛයකින් නිකුත්වන ලියවැලක විලාසය ගැනීම,එම ලියවැල කෙළවර වී ඇත්තේ විශාල වෘත්තාකාර දඟරයකිනි, පිටට පෙනෙන බිත්තියේ සිංහ හස්ති නාග හා වාමන රූප කැටයම් සහිත කොරවක්ගල ,ගජ සිංහ

හිස හෝ ඇක්හිස හෝ සිංහ හිස සහිත කොරවක් කොරවක්ගල, යාපහුවේ හා දඹදෙණියේ දළදා මාලිගාවල ඇති කොරවක්ගල් නිදසුන් ලෙස දැක්විය හැක.

ii.බුදුගුණ අලංකාරය

බුදුගුණ අලංකාරයෙහි කතුවරයා විවිධාගම හිමියන් බවත් කාව්‍යය රචනා කරන ලද්දේ සයවන බුවනෙකබාහු රජුගේ රාජ්‍යත්වයෙන් තුන්වන වසරේදී බව ග්‍රන්ථාවසානයේ සඳහන්වේ.විවිධාගම හිමියන් බුදුන් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය පෙන්වීම සඳහා නිරන්තරයෙන්ම බුදුගුණ වර්ණනා කර ඇති බව බුදු ගුණ අලංකාරය පුරාවටම දක්නටලැබේ.මිනිස් කයෙහි අස්ථිරත්වය මෙන්ම බව සසරෙහි පවත්නා බිහිසුණු ස්වභාවය පිළිබඳ ලෝවැසි ජනයාට අවබෝධ කරලීම උදෙසා බුදුගුණ අලංකාරය රචනා කරන බව කවි හිමියන් පවසන්නේ මෙපරිද්දෙනි.

'කය නම් අසාරය - භව නම් භයංකාරය
කියනුව දිවා රය -කෙරෙමි බුදුගුණ අලංකාරය'

කතු හිමියන්ගේ භාෂාව ඉතාම සරලය, කණට මිහිරිය, සිංහල සාහිත්‍යයෙහි මුල් බැසගත් ගතානුගතික උපමා රූපක යොදන තන්හිදී පවා ආසාවෙන් කියවිය හැකි අන්දමින් රසයෙන් අනූනකොට පද්‍ය රචනා කොට ඇත.

iii. මහනුවර යුගයේ බිතු සිතුවම්

බෞද්ධ පුනර්ජීවන ක්‍රියාදාමයෙහි එක් ප්‍රතිඵලයක් වශයෙන් බෞද්ධ සිතුවම් කලාව නව ආරකින් අරඹන ලදී. මහනුවර යුගයේ චිත්‍ර ප්‍රධාන වශයෙන් කොටස් තුනකි.

1.උඩරට චිත්‍ර සම්ප්‍රදාය 2.පහත රට චිත්‍ර සම්ප්‍රදාය

3.ලෙන් චිත්‍ර යනුවෙනි.

මහනුවර යුගයේ සිතුවම් තුළ දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ කිහිපයක් වේ.එනම්

*අඛන්ඩ කතන ක්‍රමය භාවිත කිරීම *සමාන්තර තීරු බෙදා ඒ අතර චිත්‍රය සිතුවම් කිරීම

*ක්‍රියාකාරීත්වය දැක්වීම අවම වීම *සිද්ධාන්ත භාවිතය අවම වීම *සෙල්ලි ගසවීම

*රේඛා භාවිතය බහුලව යොදා ගැනීම

*මෙම යුගයේ සිතුවම් සඳහා තේමාව ලෙස බෞද්ධාගමික පරිසරය මෙන්ම දේව සංකල්පය විවිධ ඇදහිලි විශ්වාසයන් හා මහායානික අදහස් මුල් කොට ගෙන මන: කල්පිත නිර්මාණ භාවිත කොට ඇත.

*උඩරට සම්ප්‍රදායේ චිත්‍ර දක්නට ඇති විහාරස්ථාන:-

*රිදී විහාරය *දඹුල්ල විහාරය *දෙගල්දොරුව විහාරය *මැදවෙල විහාරය

- පහතරට සම්ප්‍රදායේ චිත්‍ර දක්නට ඇති විහාර:-

මුල් කිරිගල විහාරය, කැලණිය පැරණි විහාරය, තොටගමු විහාරය

පහත රට විහාර චිත්‍ර ශෛලිය තුළ කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ චිත්‍රාවලියෙහි එක් එක් අවස්ථා විස්තරාත්මකව ඊට පහළින් ලියා දැක්වීමයි.

*මහනුවර යුගයේ සිතුවම් කලාව විශේෂිත වන්නේ සම්භාව්‍ය පැරණි සම්ප්‍රදායට වඩා වෙනස් වූ එයටම ආවේණික වූ ලක්ෂණයන්ගෙනි.

iv. සිව්බඹ විහරණ

සිව්බඹ විහරණ යනු :-

*මෙත්තා *කරුණා *මුදිතා *උපේක්ඛා

*මෙත්තා:-සියලු උස් පහත් භේදයන්ගෙන් තොරව සපුරා අනුන්ගේ සුවසෙත කැමති වීමයි, හපත අපේක්ෂා කිරීමයි.

*කරුණා:- අනුන්ගේ දුකේදී සැබවින්ම අනුකම්පා කිරීම කරුණාවයි.

*මුදිතා:මුදිතා යනු අනුන්ගේ සැපත දියුණුව ජයග්‍රහණය දැක ඊර්ෂ්‍යා නොකිරීමයි.

*උපේක්ඛා (උපේක්ෂා):උපේක්ෂා යනු මැදිහත් බවයි විවිධ සිතුම් පැතුම් ගතිගුණ අදහස් සුරුවි අරුවිකම් ඇති ලෝකයෙහි ඒ කිසිවකුට අන්තගාමීව පක්ෂද විපක්ෂද නොවී මධ්‍යස්ථව ක්‍රියා කිරීමයි.

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank